# බීජ ගබඩා කිරීම

**බීජ හොඳින්
ගබඩා කළ යුත්තේ ඇයි?**

සාර්ථක අස්වැන්නක් නිසා අවශ්‍ය තරම් ආහාර, මුදල් බවට පරිවර්තනය කළ හැකි භෝග හා බීජ අවශ්‍යතා සපුරා ගත හැක.

අස්වනු නෙලා ගත් විගසම ඒවා විකිණීම නොකළ යුතුය. මක්නිසාද යත්, එම වකවානුවේදී සෑම තැනකම අස්වනු නෙලන නිසා, වැඩි මිළකට විකිණීම අපහසුය. එසේ නම් කළ යුත්තේ කුමක් ද? මෙම බීජ තොගය ගබඩා කර තබා අවුරුද්දේ හිඟ මාසවලදී විකිණීමෙන් ලැබෙන ලාභය වැඩි කර ගත යුතුය.

අස්වනු නෙලා ගත් පසු බීජ එකවර ආහාරයට ගැනීමට නොහැකි නිසාත්, ඊළඟ කන්නයට පැළවීමේ ශක්තියෙන් යුත් බීජ අවශ්‍ය නිසාත් මෙම බීජ සුදුසු ස්ථානයක ගබඩා කර තිබිය යුතුය. ගබඩා කරන ලද බීජවලට මීයන්ගෙන් කුරුල්ලන්ගෙන් කෘමීන් හා ක්ෂුද්‍ර ජීවීන්ගෙන් හානි සිදුවිය හැක. තවද උන්ගේ ශරීරවලින් පිටවන රසායනික ද්‍රව්‍ය නිසා බීජ තොග අව පැහැ ගැන්වීම, දුර්වර්ණ වීම හා විෂවීම පවා සිදුවිය හැක. මේ හේතූන් නිසා බීජ හොඳින් ගබඩා කළ යුතුය.

**බීජ පැළවීමේ ශක්තිය හීන වන අන්දම**

බීජවල පැළවීමේ ශක්තිය පහත සඳහන් හේතු නිසා හීන විය හැක.

1. **අස්වනු නෙලීමට පෙර තිබූ පරිසර තත්ත්වයන්;**

   වර්ෂාව, අධික තෙතමනය, අධික උෂ්ණත්වය යන නුසුදුසු පරිසර සාධකවලට භාජනයවී පරිහානියට පත්වූ බීජ හොඳින් ගබඩාකල නොහැක.

2. **අස්වනු නෙලනවිට බීජයේ මෝරු බව;**

   නොමේරූ බීජ, බාගෙට පිරුනු ඇට, හැකිලුනු ඇට, බර අඩු බීජ, තෙතමනය අධිකව උරා ගනී. එම නිසා මෙම බීජ ද ගබඩා කිරීමට සුදුසු නොවේ. මෙම බීජ සහිතව හොඳ බීජ ගබඩා කළ විට මුලු බීජ තොගයේම පැළ වීමේ ශක්තිය හීනවී යයි.

3. **යාන්ත්‍රික හේතු නිසා පලුදු වූ බීජ;**

   මෙම බීජවල ජීව්‍යතාවය ඉක්මනින් අඩු වන අතර, සිදුවන කෘමි හානිය ද අධිකය.

4. **අධික උෂ්ණත්වය හා තෙතමනය;**

   පැළවීමේ ශක්තිය හීන වීමට ප්‍රධාන වශයෙන්ම බලපාන සාධක දෙකක් නම් අධික උෂ්ණත්වය හා තෙතමනයයි. මෙම තත්ත්ව වල බීජ ගබඩා කළ විට, එම බීජ අවට තෙතමනය උරාගෙන බීජයේ ස්වසනය වැඩි වේ. තවද කෘමීන් හා ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරකම්ද වැඩි වේ. සෑම විටම ක්ෂුද්‍ර ජීවීන්ට හිතකර පරිසරය වනුයේ තෙතමනය වැඩි බව හා වැඩි උෂ්ණත්වයයි. ගබඩාවේ ආර්ද්‍රතාවය (වාතයේ තිබෙන තෙතමන ප්‍රමාණය) 65% වඩා වැඩි නම් හා බීජවල තෙතමනය 9% වඩා වැඩිනම් ක්ෂුද්‍ර ජීවීන් හා කෘමීන් ක්‍රියාකාරී වීමට පටන් ගැනීම නිසා අධික ලෙස බීජ හානි වීමට පටන් ගනී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
සහකාර අධ්‍යක්ෂ
**ගාමිණී ද සිල්වා
විසිනි.**

තවද අධික තෙතමනයකින් යුත් බීජවලට වැඩි උෂ්ණත්වයකින් යුත් පරිසරයකින් සිදුවන හානිය වැඩිය. ගබඩාවේ උෂ්ණත්වය සෙ.ග්‍රේ. අංශක 5 න් වැඩි වූ විට ගබඩා කර ඇති බීජවල ජීව්‍යතාවය 1/2 පමණ අඩුවන අතර, බීජවල 5%-14% අතර පවතින තෙතමනය 1% අඩු වූ විට, බීජවල ගබඩා කර තැබිය හැකි කාලය දෙගුණ වන බව ද මෑතකදී කරන ලද පර්යේෂණ වලින් සොයා ගෙන තිබේ.

5. **දිලීර මගින්;**

   තෙතමනය අධිකවූ විට දිලීර වේගයෙන් වැඩීමට පටන් ගනී. දිලීර වර්ධනය සමඟ බීජවලට සිදුවන හානිය ද වැඩි වේ. සමහර එළවළු බීජ වර්ග දිලීර හානියට ඔරොත්තු දෙන අතර ධාන්‍ය වර්ග අධිකව දිලීර හානියට ගොදුරු වේ.

6. **කෘමීන්;**

   කෘමීන් බීජයේ භ්‍රෑණපෝෂයේ හා කලලය යන දෙකටම හානි කල හැකිය.

7. **පළිබෝධ මගින්;**

   මීයන්, කුරුල්ලන්, බීජ ආහාරයට ගන්නා අතර, පිරිසිදු බීජ තොග අපවිත්‍ර කිරීම හා ආහාරයට නුසුදුසු කිරීම ද සිදු කළ හැක.

8. **බීජ වර්ගවල ආවේණික ජීව්‍යකාල මගින්;**

   සමහර බීජ වර්ගවලට ජීව්‍යතාවය බොහෝ කාලයක් රැකගත හැකි කමක් පවතින අතර, (සමහර ඝණකම පොත්ත සහිත රනිල වර්ග) සමහර බීජ වර්ග කොපමණ හොඳ ගබඩාවක තැබුවත් ජීව්‍යතාවය අඩු කාලයකට සීමා වේ.

**ගබඩා කිරීම සඳහා බීජ සකසන අයුරු**

ජීව්‍යතාවයෙන් අඩු බීජ, වැඩි කල් ගබඩා කළ නොහැකි නිසාත්, ඉතා හොඳ ගබඩාවක් යටතේ වුවත් සිදු වනුයේ බීජවල ශක්තිය හා ජීව්‍යතාවය හීනවන වේගය අවම කිරීම නිසා, පළමුව ගබඩා කිරීම සඳහා බීජ පහත සඳහන් අන්දමට සකස් කරගත යුතුය.

නියම කාලයට භෝග වගාකළ යුතු අතර නියම කාලයට අස්වනු නෙලිය යුතුය. අස්වනු නෙලන විට බීජවලට හානි සිදු වීම වැළැක්වීමට පියවර ගැනීම ඉතා වැදගත්.

බීජ හොඳින් ශුද්ධ කරන්න. සල්ලඩ මගින් හුළං කිරීමෙනුත්, අතින් ඇතිල්ලීමෙනුත්, අපද්‍රව්‍ය, ගල්, වැලි හා වෙනත් බීජ කැබලි ඉවත් කරන්න.

මෙම පිරිසිදු බීජ හොඳින් වේලා ගන්න. මෙය ඉතාමත් වැදගත් වේ. බීජ හොඳින් වියලුණු තරමට කෘමි හානිත් අඩුය. මෙහිදී බීජ කෙලින්ම පොළොව සමඟ ස්පර්ශ වීමට ඉඩ නොදී කැන්වස් රෙද්දක් හෝ තහඩුවක් මත තබා වියලන්න. නැතහොත් පොළවේ තෙතමනය බීජ මගින් උරා ගනී.

බීජ හොඳින් වියළී ඇති බව බීජයක් දතට තබා හැපීමෙන් දැනගත හැක. විකිමට තද නම් හොඳින් වියලී ඇත.

මෙම හොඳින් වියලුනු පිරිසිදු බීජ පිරිසිදු ගෝනිවල හෝ භාජනවල අසුරන්න.

(ලබන කලාපය බලන්න)